**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2015**

----------------------------------------------------------------------

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ 10(ඇ) (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1. මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ස්ථාවර වත්කම් ක්ෂය රු. 94,921 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පුහුණු සැලැස්මක් සකස් කිරීම සඳහා වූ රු. 793,000 ක ගිවිසුම්ගත බැඳීමක් ශේෂපත්‍ර දිනෙන් පසුව අවලංගු වී තිබුණද ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජාතික නිපුණතා සම්මත ඇතුළත් සංයුක්ත තැටි 1877 ක් සහ කාර්යාලීය ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගත යුතු රු. 1,123,118 ක් 2016 මැයි 05 දින දක්වාම ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ආ) 2006 හා 2010 වර්ෂවලදී සේවයෙන් ඉල්ලා අස්වූ සේවකයන් තුන්දෙනෙකුගෙන් අයවිය යුතු රු. 165,183 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,947,804 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දී රු. 2,250,877 ක අතිරික්තයක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,198,681 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු. 6,112,401 කින් වැඩි වී තිබුණ ද, වර්ෂයේ සේවක පිරිවැය රු. 9,937,250 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂ 5 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2015 වර්ෂවල දී ඌනතාවයක් වූ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ඉතිරි වර්ෂවල අතිරික්තයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු.

30,198,474 ක් හා රු. 41,989,597 ක් විය. එය 2013 වර්ෂයේදී රු. 39,198,869 ක් දක්වා අඩු වුවද නැවත 2014 වර්ෂයේ දී රු. 51,064,746 ක් හා සමාලෝචිත වර්ෂය වන විට රු. 58,555,774 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා සංවර්ධනය, ජාතික වශයෙන් පිළිගත් සහතික පත්‍ර පිරිනැමීම හා පුහුණු සම්මතයන් පවත්වාගෙන යාම ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණු ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) (i) රාජ්‍ය හා පෞද්ගලික ආයතන 500 ක් අලුතින් ලියාපදිංචි කිරීම සඳහා හා ආයතන 400 ක් ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඇගයීමට ඉලක්ක කලද, පිළිවෙලින් ආයතන 297 ක් හා ආයතන 343 ක් පමණක් ඇගයීමට ලක්කර තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 24 ක අඩුවීමකි.

(ii) රාජ්‍ය අංශයේ පාඨමාලා 503 ක් හා පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල පාඨමාලා 108 ක් ජාතික පුහුණු මට්ටම් සඳහා ප්‍රතීතනයට ඇගයීමට ලක් කර තිබුණද, පිළිවෙලින් පාඨමාලා 339 ක් හා 53 ක් පමණක් ප්‍රතීතනය කර තිබූ අතර එම සංවිධානවල පාඨමාලා 259 ක් ප්‍රතීතනය අළුත් කිරීම සඳහා ඇගයීම් කර තිබුණ ද පාඨමාලා 177 ක් පමණක් අළුත් කර තිබුණි.

(ආ) ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණයකට අනුව වෘත්තීය පුහුණුව සම්බන්ධ පාඨමාලා 9522 ක් පැවැත්වෙන බවත් එයින් සමාලෝචිත වර්ෂයේදී ජාතික පුහුණු මට්ටම සඳහා ප්‍රතීතනය වී තිබූ පාඨමාලා සංඛ්‍යාව 2323 ක් එනම් සියයට 24 ක් බවත් හෙළිදරව් කරගෙන තිබුණි. පනත අනුව සියලු පාඨමාලා ජාතික වෘත්තීය මට්ටම් යටතේ පවත්වාගෙන යාම ආයතනයේ වගකීම වුවද ඉහත පාඨමාලා ලියාපදිංචි කර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙළක් ආයතනය සතුව නොතිබුණි.

(ඇ) ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටම සඳහා සහතිකපත් 60 ක් නිකුත් කිරීමට ඉලක්ක කළද සහතික 09 ක් පමණක් නිකුත් කර තිබූ අතර ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම සඳහා නිකුත් කර තිබුනේ සහතික 1471 ක් පමණ අඩු සංඛ්‍යාවකි. මේ අනුව ජාතික වෘත්තීය සුදුසුකම් 5 හා 6 මට්ටමවල සුදුස්සන් බිහිවීම අඩු මට්ටමක පවත්නා බව නිරීක්ෂණය විය.

(ඈ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශවල වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට මූල්‍යාධාර සැපයීමේ වැඩපිළිවෙලක් ආයතනය විසින් ක්‍රියාත්මක කර තිබූ නමුත් ඒ සඳහා ආයතන තෝරා ගැනීම සඳහා පිළිගත හැකි නිර්ණායක තීරණය කර නොතිබුණි. තවද වර්ෂය තුළ දී මූල්‍යාධාර ලෙස රු. 2,569,912 ක් ප්‍රදානය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාඨමාලා 13 ක් ප්‍රතීතනය කරගෙන නොතිබුණි.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර, මුල් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ වෘත්තීය පුහුණු සැලැස්ම යාවත්කාලීන කිරීම, වාර්ෂික සමීක්ෂණ 6 ක් සිදුකර කෙටුම්පත් වාර්තා ලබා ගැනීම, පරිගණක මෘදුකාංග මිලදී ගැනීම, භූගෝලීය තොරතුරු පද්ධතිය පුළුල් කිරීම යන කාර්යයන් ඉටුනොකර ඊළඟ වර්ෂයට කල්දමා තිබුණද ඒ සඳහා වූ හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) වර්ෂය තුළ දී පර්යේෂණ 06 ක් සම්පූර්ණ කිරීම සඳහා රු. 500,000 ප්‍රතිපාදනය කර තිබුණද එක් පර්යේෂණයක් හෝ සම්පූර්ණ කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 28.51 ක් වෙන් කර දී තිබූ අතර වර්ෂය තුළදී රු. මිලියන 27.5 ක් වැයකර තිබුණද ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වූ පහත කාර්යයන් ඉටුකර නොතිබුණ බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලාංකිකයන් රැකියාගත කර ඇති විදේශ ආයතන 10 ක බලධාරීන් සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් ජාත්‍යන්තර තත්ත්වය හා සමාන බව තහවුරු කර ගැනීම, වෘත්තීය ආයතනවලින් පිටවන උපාධිධාරීන් සඳහා විදේශ රැකියා ගිවිසුම්වලට එළඹීම, ඇගයීම් ක්‍රියාවලියට අදාල ප්‍රමිත සමාලෝචනය හා එම ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ ප්‍රමිතින් උසස් කිරීම සඳහා පාසල් ගුරුවරුන් පුහුණු කර ලියාපදිංචි කර ගැනීම හා ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහ 6 මට්ටමේ ඇගයීම්කරුවන් බඳවා ගැනීම.

(ii) කොමිෂන් සභාව විසින් හඳුනාගත් නව ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා සිසුන් 10,000 ක් බඳවා ගත හැකි පරිදි පාඨමාලා ආකෘති වැඩිදියුණු කිරීම, සිසුන් සඳහා කාර්යසාධනය පදනම් කරගත් ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දීම, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5,6 සහ 7 සඳහා රජයේ බඳවා ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව ප්‍රතිපත්ති හා මූල්‍යායන වැඩපිළිවෙළක් සකස් කිරීම, වෘත්තීය තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා ලිංග ප්‍රතිපත්තියක් (Gender policy) සකස් කිරීම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා වෘත්තීයමය ප්‍රවර්ධන වැඩපිළිවෙලක් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් සකස් කිරීමට කැළණිය විශ්වවිද්‍යාලයට රු.199,000 ක් 2013 වර්ෂයේදී ගෙවා තිබුණි. ගිවිසුම අනුව එම සැලැස්ම 2014 මැයි 05 දින අවසන් කළ යුතු වුවත්, එසේ සිදු නොකිරීම නිසා 2016 ජනවාරි 13 දින කොමිෂන් සභාව විසින් ගිවිසුම අවසන් කර තිබුණු අතර විශ්වවිද්‍යාලය විසින් අවසන් නොකළ වාර්තාවක් ආයතනයට ලබා දී තිබුණි. පුහුණු සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රමාණවත් ඉදිරි ක්‍රියාමාර්ග 2016 මැයි 05 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය පිණිස නිපුණතා පාදක ඇගයීම් කටයුතු සඳහා ඇගයීම්කරුවන් පත්කිරීම 2013 වර්ෂයේ සිට මෙම ආයතනය වෙත පැවරී තිබූ නමුත් 2015 වර්ෂය අවසානය දක්වාම ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රමාණවත් පුද්ගලයින් සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා බඳවාගෙන තිබූ මුළු ඇගයීම්කරුවන් සංඛ්‍යාව 1945 ක් වුවද, එම ඇගයීම්කරුවන් ක්‍රියාකාරී සේවයේ යෙදෙන බවට තහවුරු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාව විසින් පාඨමාලා 2945 ක් ඇගයීම සඳහා ඇගයීම්කරුවන් පත්කර තිබුණද එය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පාඨමාලා 3188 ක් ඇගයීම් සඳහා ආයතන විසින් තෝරාගත් ඇගයීම්කරුවන්ට සභාවේ අනුමැතිය ලබා දී තිබුණි. මේ නිසා එම ඇගයීම්වල ස්වාධීනතාවය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(iii) ඇගයීම්කරුවන් පත් කිරීමෙන් පසු මාස දෙකක් ඇතුළත ඇගයීම සිදු කළ යුතු වුවද ඒ සඳහා මාස 03 සිට මාස 08 දක්වා කාලයක් ද, ඇගයීම් කිරීමෙන් පසු ගෙවීම් කිරීම සඳහා මාස 05 සිට මාස 20 දක්වා කාලයක් ද ගතකර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) පසුගිය වර්ෂ කිහිපයක පර්යේෂණ ප්‍රතිඵල ආයතනයේ සංවර්ධනය සඳහා යොදාගැනීම අඩු මට්ටමක පැවති අතර ඒ පිළිබඳ පසු විපරම් කර නොතිබුණි. 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු. 546,930 ක් හා රු. 493,000 ක් වැයකර සකස් කර තිබූ පර්යේෂණ වාර්තා 09 ක කරුණු විගණිත දිනය වූ 2016 අප්‍රේල් 25 දින දක්වාම එළි දක්වා නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.3.1 හා 4.4 වගන්ති අනුව සම්පූර්ණ කළ යුතු අනිවාර්ය සේවා කාලය වයස අවුරුදු 55 එළැඹීමට ප්‍රථම වසර 10 ක් සම්පූර්ණ විය යුතු වුවත් එයට පටහැනිව අවුරුදු 48 ක් වූ නිලධාරියෙකු චීනයේ වුහාන් විශ්ව විද්‍යාලයේ වර්ෂ 3 ක ප්‍රතිපත්ති විශ්ලේෂණ පාඨමාලාවක් සඳහා තෝරාගෙන සම්පූර්ණ පඩි සහිත අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. එම පාඨමාලාවේ මුළු පිරිවැය රු.8,048,160 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා පාඨමාලා ගාස්තු වෙනුවෙන් රු. 2,038,826 ක් වැයකර තිබුණු අතර අයදුම්කරු විසින්ම තෝරාගෙන තිබූ මෙම පාඨමාලාවේ අදාලත්වය හා පිරිවැයට ප්‍රමාණවත් වූ ප්‍රතිලාභ ආයතනයට හා රටට ලැබේදැයි යන්න පිළිබඳව පිළිගත හැකි, සාධාරණ ඇගයීමක් සිදුකර නොතිබුණි.

**4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති**

-------------------

කර්මාන්ත 04 ක් සඳහා ඉල්ලුම හා සැපයුම සම්බන්ධයෙන් පවතින පරතරය පිළිබඳව සමීක්ෂණය (Survey on Industries Demand Gap) 2014 නොවැම්බර් 08 දින නිමකළ යුතු වුවද විගණිත දිනය වූ 2016 මැයි 05 දින දක්වාම නිමකර නොතිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 26 ක් වූ අතර ඉන් 21 ක් විධායක ශ්‍රේණියේ විය. සේවයේ නියුතු විධායක ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙක් ශිෂ්‍යත්ව මත අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී තිබුණි. මෙම පුරප්පාඩු නොපිරවීම නිසා ඇගයීම්කරුවන් පත්කිරීම, ආයතන සහ පාඨමාලා ජාතික වෘත්තීය පුහුණු මට්ටම (NVQ) සඳහා ලියාපදිංචි කිරීම හා ප්‍රතීතනය කිරීමට ඇගයීම් කිරීම ආදී ආයතනික කාර්යයන්හි කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අධ්‍යක්ෂ තනතුර සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා වර්ෂ 06 කට අධික කාලයක් වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි. තවද නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ද්විතීක

පදනම මත නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය වෙත මුදාහැර තිබූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ද වැඩ බැලීමේ පත්වීමක් සිදුකර තිබුණි. වැඩ බැලීමේ පත්වීම් මාස 03 කට අධික කාලයකට සිදුකළ නොහැකි වුවද ඊට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 5 දෙනෙකුගෙන් යුතු වූ නමුත් එයින් සහකාර අධ්‍යක්ෂ තනතුරු 03ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ප්‍රමාණවත් විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි. තවද නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති වියදම් විගණනය කර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 43 සිට සියයට 100 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.